

# බෝග වගාව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි
එස්. නවේසන් මහතා විසිනි.

**බිම් සකස් කිරීම**

පැලෑටීන්ගේ වැඩීමට අවශ්‍ය වඩාත් සුදුසු තත්වයක් ඇති කර ලීම සඳහා පසේ සිදු කරන කටයුතු බිම් සකස් කිරීම යනුවෙන් හැඳින්වේ. බෝගයන් නිෂ්පාදනයට අවශ්‍ය වන නමුත් බිම් සකස් කිරීම මුදල් වියදම් වන වැඩකි. අතුරුයත් ගෑම, පෝරු ගෑම හා හෑම සාමාන්‍ය පොදු බිම් සකස් කිරීමේ ක්‍රම යන් වෙති. උදළු වලින් වැඩ කිරීම කුඩා ඉඩම් වලට සීමාවූ බිම් සකස් කිරීමේ ක්‍රමයකි. පැල සිටුවීමට හෝ ඇට ඉසීමට පෙර කෙරෙන පස් සකස් කිරීමේ කටයුතු මූලික සකස් කිරීමේ කටයුතු වලට ඇතුළත් වෙයි.

**බිම් සකස් කිරීමේ අරමුණ**

බිම් සකස් කිරීමට අවශ්‍ය ප්‍රධාන කරුණු නම්—

1. සුදුසු වැපුරුම් බිමක් පිළියෙල කිරීම —
2. වල් පැලෑටි වල තරඟය ඉවත් කිරීම.
3. පසේ භෞතික තත්ත්වයන් වැඩි කිරීම. එමගින් වැසිදිය පිටාර ගැලීම අඩු කිරීම. තෙතමනය සංරක්ෂණය කිරීම. වඩා හොඳ වාතනයක් ඇති කිරීම.

සාර්ථක ලෙස බෝග වගා කිරීමට සතුටුදායක පාංශු තත්ත්වයන් තිබිය යුතුය. පස සකස් කිරීමෙන් මෙම අරමුණ ඉටු වෙයි. මෙම කාර්ය ඉටු කිරීමේදී ඉඩම් වල ඇති වෘක්ෂ ලතාදිය විනාශ කිරීම අවශ්‍ය වෙයි. (වල් පැලෑටි) හෝ කලින් බෝගයක ඉතිරි කොටස් ද ඉවත් කළ යුතුය. (වී, දුම්කොළ, මිරිස්, රට කජු ආදිය.) එමෙන්ම බෝග අවශේෂයන් ද පසට එකතු කළ යුතුය. (දුම්කොළ හෝ වී වගාවට පෙර පසට යොදන අඩන හිරියා වැනි කොළ පෝර වර්ගයක්)

පැලෑටි ආහාර, ජලය හා ඉරුඑළිය ලබා ගැනීමට බෝග සමග වල් පැල තරඟ කරති. එමගින් බෝගවල අස්වැන්න අඩුවේ. එමගින් විශාල පාඩු සිදුවේ. වල් පැල විනාශ වීම නිසා බිම් සකස් කිරීම වැදගත් කාර්යයක් වෙයි.

පස් බුරුල් කිරීමෙන් වාතනය ඇතිවන වාත් හැර, ක්ෂුද්‍ර ප්‍රාණීන්ගේ ක්‍රියාකාරිත්වය වර්ධනයවී පෝෂ්‍ය පදාර්ථයන් පැලෑටි වලට වැඩියෙන් ලැබේ. (විශේෂයෙන්ම ජීවාන් තක) එමෙන්ම වැසිකාලයේදී තෙතමණය ආරක්ෂාවීම, එමගින් ඉඩම් වලින් ජලය පිටාරය ගැලීම හා පස් සෝදා යෑම වලකී.

**වැපුරුම් බිම පිළියෙල කිරීමට අවශ්‍ය ගොවි උපකරණ**

වැපුරුම් බිමක් පිළියෙල කිරීමට අවශ්‍ය ප්‍රධාන ගොවි උපකරණ අතර, උදැල්ල, නගුල්, (ගම්බද ලී නගුල, ගවයින් විසින් ඇද ගෙන යන යකඩ නගුල, ට්‍රැක්ටරයෙන් ඇදගෙන යන රෝද නගුල හෝ හැඩලැලි නගුල) හා පෝරු.

මෙම උපකරණයෙන් පස යටට ඇවිස්සෙන ප්‍රමාණය හා ගැඹුර වෙනස් වන අතර, වල් පැලෑටි විනාශ වන වන තරම ද වෙනස් වෙයි. බෝග අවශේෂයන් පිහිටන ක්‍රමය හා ගොවි කටයුත්තක් කිරීමට වන වියදම ද වෙයි.

ඉතාමත්ම සරල ලාබදායි ගොවි උපකරණය උදල්ලයි. හරකුන්ට හෝ ට්‍රැක්ටර් යන්ත්‍ර වලට වැඩ කළ නොහැකි කුඩා බිම් කොටස් වල හා තවාන් ආදියෙහි වැඩ කටයුතු කිරීමට එය සුදුසුය. එය ක්‍රියාවේ යෙදවීමට උපයෝගී කරගනු ලබන්නේ මනුෂ්‍ය ශ්‍රමයයි. එබැවින් උදළු පාවිච්චිය බොහෝ මුදල් වියදම් වන ඉතා හෙමින් වැඩ කෙරෙන ක්‍රමයකි.

නගුල් වර්ග බොහෝ ගණනක් තිබේ. මෙයින් නිෂ්පාදනයට ඉතාමත්ම පහසු ගම් බද ලී නගුලයි. එහෙත් හැඩ ලෑලි නගුලෙන් මෙන් ගම්බද ලී නගුලෙන් පස් පෙරලීමක් සිදු නොවේ. ගවයින් විසින් අදිනු ලබන හැඩ ලෑලි සැහැල්ලු යකඩ නගුල, මේ නගුලේම දියුණු කරන ලද නගුලකි. ගොන් බානක් හා සැහැල්ලු යකඩ නගුලකින් දිනකට ගොවියකුට පසේ තත්ත්වය උඩ අක්කරයක පමණ පොළොව හෑ හැක. මෙම වැඩ ප්‍රමාණය ලී නගුලකින් කළ හැකි ප්‍රමාණයට වඩා බොහෝ වැඩිය. තවද, සැහැල්ලු යකඩ නගුල පාවිච්චි කරන විට පස් පිඩැලි පෙරලෙයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සැහැල්ලු යකඩ නගුල් විකුණනු ලැබේ.

ට්‍රැක්ටර් මගින් ඇද ගෙන යනු ලබන හැඩ ලෑලි නගුල් හා තැටි නගුල් විශාල ගොවි ව්‍යාපාර වලට සුදුසුය. මෙම උපකරණය ක්‍රියා කරවන්නෙකුට දිනකට අක්කර 2-3 දක්වා ප්‍රමාණයක් හෑ හැක. අක්කරයක තැටි පෝරු ගෑමට රු. 30-40 දක්වා ප්‍රමාණයක් වියදම් වෙයි. හැඩ ලෑලි නගුල් වල හැඩ ලෑල්ලේ හැඩය අනුව සමහර නගුල් වල හැඩ ලෑල්ල බොහෝ වක්වී ඇති බැවින් පස් වැඩියෙන් කුඩු වෙන අතර, අනික් නගුල් වර්ගයක හැඩ ලෑල්ලේ එපමණ වක්‍රයක් නොමැති බැවින් එතරම් පස් කුඩුවීමක් සිදු නොවේ.

පෝරු වර්ග ද ගණනාවකි. තැටි පෝරු, ඇන දත් පෝරු, දුනු දත් පෝරු, හා තල පෝරුවයි. මෙයින් රට තුළ වැඩිමනත්ම පාවිච්චි වන්නේ තැටි පෝරුවයි. පොළොවේ අවශ්‍ය පමණට වඩා වල් පැල ඇත්නම් හෝ තැටි නගුලෙන් පොළොව හා ඇත්නම් තැටි පෝරුව පාවිච්චි කරනු ලැබේ. සාමාන්‍ය තත්ත්වයන් යටතේ වැඩ කරන්නෙකුට දිනකට අක්කර 4 ක් පමණ පෝරු ගෑ හැකි විය යුතුය. අක්කරයක් පෝරු ගෑමට රු. 25-30 දක්වා ප්‍රමාණයක් වියදම් වෙයි.

විශේෂයෙන් ම වී වගාවේදී පාවිච්චි කරන තවත් ගොවි උපකරණයක් නම් ටයින් කල්ටිවේටරය නැමැති නගුල් වර්ගයයි. තැටි පෝරුවෙන් හෝ හැඩ ලෑලි නගුලෙන් පස හානවිට පස පෙරලෙන ලෙස ටයින් කල්ටිවේටරය පාවිච්චි කරන විට නොපෙරලෙනවාත් හැර, එයින් වන්නේ පස ඇවිස්සෙන එක පමණි. කුඹුරේ ජලය ඇත්නම් බොහෝ මැටි ඇති පසක වාර ගණනක් ටයින් කිරීමෙන් කුඹුර මනා ලෙස මඩවන බැවින් වී ගොවිතැනේ දී ටයින් කල්ටිවේටරය බොහෝ ජනප්‍රියවී ඇත.

**මනා වැපුරුම් බිමක් පිළියෙල කිරීමේදී කෙරෙන ගොවි වැඩ**

වැපුරුම් බිමක් මනා ලෙස පිළියෙල කර ගැනීම අවශ්‍යයි. එහෙත් පවතින තත්වයන් උඩ පිළියෙල කිරීමේ ස්වභාවය හා ප්‍රමාණය රඳා පවතී.

**දැනට පවතින තත්ත්වය අනුව**

1. පස් සකස් කිරීමේ වැඩ වාත් සරල ඒවා විය යුතුය.
2. හැකි තරම් අඩුවෙන් පස ඇවිස්සීම.
3. රසායනික වල් පැල මර්ධන ක්‍රම තවත් පුළුල් ලෙස පාවිච්චි කිරීම හා එමගින් පස් ඇවිස්සීම හැකි තරම් දුරට අඩු කිරීම.
4. බෝග අවශේෂයන් අඩු වශයෙන් යොදා පස් සේදී යෑම අඩු කිරීම හා වරුසා වතුර පිටාර ගැලීම විශේෂයෙන්ම වියලි පළාත්වල වැලැක්වීම පිළිබඳව වඩාත් සැලකිල්ල යොමු කිරීම.

අවශ්‍ය පමණට වඩා දිගින් දිගට පස හෑම පසට අන්තරායකාරී වනවාත් හැර වගා වියදම ද වැඩි වෙයි. එමගින් පසේ ඇති ජෛවේන්ද්‍රිය පොහොර ප්‍රමාණය වහා විනාශ

මී යනවාත් හැර පාංශුවයනය ද විනාශ වී යයි. එබැවින් බෝගයක් සඳහා ඉඩම් පිළියෙල කිරීමේදී අඩුම වාර ගණනක් පස ඇවිස්සිය යුතුය. කලින් බෝගයක් තිබුණ ඉඩමක වල් පැල ද තොරවේනම්, එක් වරක් පමණක් හැම හෝ පෝරු ගෑම සෑහේ.

ඇත්ත වශයෙන්ම ඇමෙරිකා ජනපදයේ බඩ ඉරිඟු නිපදවන විට පස හෑම, පොහොර යෙදීම හා ඇට සිටුවීම ආදිය යන්ත්‍ර මගින් එකවරටම අවසන් කෙරේ.

වියලි කලාපයේ බොහෝ ස්ථානවල මෙන් ඉඩම වගා වන්නේ වසරකට එක් වරක් පමණක් නම්, වල් පැල ද බොහෝ වැඩි ඇත් නම් පමණක් එක් වරකට වඩා පොලොව හෑම අත්‍යවශ්‍ය වෙයි. ඒ අනුව සෑම වර්ෂා වාරයකම අවසානයෙහි වල් පැල මරා දැමීමට අප්‍රේල් මැයි, ජූනි සමයේ දී 3-4 වරක් පොලොව හෑම අත්‍යවශ්‍ය වේ. කන්නයේ ලැබෙන සම්පූර්ණ වර්ෂාවෙන් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට ඔක්තෝබර් මාසයේ ලැබෙන පලමු වර්ෂාවත් සමග වී හෝ වෙනත් ගොඩ බෝගයක් වල් පැලැටි නොමැති ඉඩමක වගා කල හැක. වැසි දියෙන් යැපෙන බෝගයන් ලාබදායි වීමට නම් සැප්තැම්බර්-ඔක්තෝබර් කාල සීමාවේ දී සිටවිය යුතුය. මේ සඳහා වල් පැල වලින් තොර බිමක් අවශ්‍යය. අවාරයේ දී බොහෝ වාරයක් පෝරු ගෑමෙන් හෝ හෑමෙන් හෝ මෙය ඉටු කල හැකිය.

එසේ නැත්නම් ඉඩම එක වරක් පමණක් බිම් නගා ඉන්පසු නැගෙන වල් පැල විනාශ කිරීම උදෙසා වල් නාශකයක් යෙදිය හැක. උදා—පැරක්වට්.

ට්‍රැක්ටර් යන්ත්‍ර පහසුවෙන් සොයා ගැනීමට නොමැති පලාත්වල මේ ක්‍රමය ක්‍රියාවේ යෙදීම සුදුසුය. බිම් නැගීමට වඩා මේ ක්‍රමය ලාබදායී වනවාත් හැර පසට එතරම් අන්තරායකාරීද නොවේ. ස්ථිර බෝග වගාවක (පොල්, දෙහි, අඹ, දොඩම්, මිදි) පොළොව වල් පැල වලින් තොරව තබා ගැනීමට මෙය අගනා ක්‍රමයකි. එමෙන්ම ට්‍රැක්ටර් යන්ත්‍ර පාවිච්චි කල නොහැකි මුල් ආදිය ඇති ඉඩම්වල ද වල් පැල විනාශ කිරීමට ද මෙය අගනා ක්‍රමයකි.

**මනාලෙස ඉඩම් පිළියෙල කිරීමෙන් ඇතිවන ප්‍රයෝජන**

1. තෙතමණය ආරක්ෂාවීම.
2. පසේ වඩා හොඳ වාතනය.
3. වල් පැල විනාශ කිරීම.



ගම්බද නගුල — මෙයින් පස පෙරලීමක් සිදු නො වේ. පස් බුරුල්වීම හා කැට පොඩි වීම පමණක් සිදු වේ. මෙම නගුලකින් අක්කරයක් හෑමට පැය 15—30 ක් දක්වා කාලයක් ගතවේ.




ගවයින් විසින් ඇදගෙන යනු ලබන හැඩලැලි නගුලක්.
පස පෙරලී වල්පැල පසට යටවෙයි.

නගුලේ—

අ—පැත්තකින් පෙනීම
ආ—නගුලක් පසු පසින් පෙනෙන අයුරු
ඇ—නගුලක් උඩින් පෙනෙන අයුරු

මෙම නගුලකින් අක්කරයක් හෑමට පැය 12—30 දක්වා කාලයක් ගත වෙයි.



ට්‍රැක්ටර් යන්ත්‍රයෙන් ඇදගෙන යනු ලබන තැටි නගුල.
පස තරමක් පෙරලෙයි. මෙම නගුලෙන් දිනකට අක්කර ½—¾ දක්වා ප්‍රමාණයක් හෑ හැක.

4. කාබනික ද්‍රව්‍ය වඩා ප්‍රයෝජනවත් සේ පාවිච්චි කිරීම.

5. පස බුරුල් කිරීම.

6. වඩා බුරුල් පස තද කිරීම.

වියළි කලාපයේ විශේෂයෙන් ම තෙතමනය ආරක්ෂා කිරීම ඉතා වැදගත්ය. ජලය පසට කිඳා නොබසින ඉතාමත්ම තද පසක වැසි වතුර සීඝ්‍රයෙන් ගලා ගොස් පස් සෝදා යෑම සිදු කරයි. පොළොව යටට කිඳා බසින්නේ ජලය ස්වල්පයකි. පොළොව යට ජලය ගබඩා නොවන බැවින්, වියළි දේශ ගුණයක් ඇති කාල සීමාවල දී ස්ථිර බෝග (පොල්, රබර්, දොඩම් ආදී) වලට ද හානි ඇති වේ. බුරුල් පසක් ඇති විට පොළොවේ පහත මට්ටමකට ජලය කිඳා බැස පොළොව යට ජලය ගබඩා කෙරේ.



ට්‍රැක්ටරයෙන් ඇදගෙන යනු ලබන තැටි පෝරුව. අඩි 6 ක් පළල තැටි පෝරුවට දිනකට අක්කර 1½ — 2 දක්වා ප්‍රමාණයක් තැටි පෝරු ගෑ හැක.



ඇන පෝරුව — තැටි වලින් මෙන් මෙ මගින් පසට හානියක් සිදු නො වේ. මෙ මගින් දිනකට අක්කර 1— 1½ දක්වා හෑ හැක.

විශාල රස පදාර්ථ ප්‍රමාණයක් හා ජලය ප්‍රමාණයක් වල් පැල ඇද ගනී. සියළු බෝග යන්ගේ අස්වැන්න එමගින් අඩුවේ. (ස්ථිර හා වාර්ෂික) ඒ අනුව වල් පැල විනාශ කිරීමෙන් බෝග වලට ඒවායේ වැඩීමට පමණක් තෙතමනය හා රස පදාර්ථ සොදා ගත හැක. පසේ වාතනය ඇති කිරීමෙන් ක්ෂුද්‍ර ප්‍රාණීන්ගේ ක්‍රියාකාරීත්වය අධික වේ. එමගින් සමහර රස පදාර්ථ (උදා.—ජීවාන්තක) විශේෂයෙන්ම මැටි වැඩි පසේ වැඩියෙන් ලැබේ. පසට කාබනික පොහොර (ගොම, කොම්පෝස්ට්, කොළ පෝර) අඩංගු කිරීමෙන් හෝ වසුනක් වශයෙන් පොළොව මතුපිට තැබීමෙන් පැළෑටිවලට අවශ්‍ය රස පදාර්ථ අධිකයෙන් ලැබේ. එමෙන්ම පස තුළ ක්ෂුද්‍ර ප්‍රාණීන් ප්‍රමාණයද, පසේ ජලය රඳවා ගැනීමේ ශක්තිය ද වැඩිවන අතර, පසේ ව්‍යුහය ද දියුණු වෙයි. පසේ විශේෂයෙන්ම මැටි වැඩිවීම නිසා පස තදවීම හේතුකොට ගෙන එහි බෝග මනා ලෙස නොවැඩේ. පැළෑටි වල වැඩීම උදෙසා එවැනි පස බුරුල් කල යුතුය. ඊට ප්‍රතිවිරුද්ධ වූ වැලි පසේ ස්විවරතාවය වැඩි බැවින් පස මැටි දමා වඩාත් බර කිරීමෙන් පැල සරුවට වැඩේ.

**මනා වැපුරුම් බිමක තිබිය යුතු ගුණාංග**

ඇට පැල වෙන්නේ වැපුරුම් බිමකයි. ඉන් නැගෙන පැළෑටි මුල් ඛනිජ ද්‍රව්‍ය හා තෙතමනය ඇද ගන්නේ මේ මාධ්‍යයෙනි. එබැවින් වැපුරුම් බිමක මනා ලෙසට තෙතමනය, රස පදාර්ථ, වාතය තිබිය යුතුවාත් හැර, පැළෑටි මුල් වලට හොඳින් වැඩී ඇදී යෑමට පුළුවන් විය යුතුය. වැපුරුම් බිම මනා ලෙස පිළියෙල කල යුතු කාලය බෝගය සිටුවීමට පෙරාතුවය. සෑම බෝගයක් සිටුවන සෑම වැපුරුම් බිමකට ඉහත කී තත්ත්වයන් සමාන වන නමුත් සමහර විශේෂ බෝග සඳහා වෙනස් තත්ත්වයන් අවශ්‍යය. කුඩා ඇට ඇති බෝගවලට සියුම් ලෙස පිළියෙල කල වැපුරුම් බිමක් අවශ්‍ය වන අතර, ඇට ඉස්ස විගසම පස මනා ලෙස තද කළ යුතුය. විශාල ඇට ඇති බෝග (රට කජු, බඩ ඉරිඟු ආදියට) එතරම් සියුම් වැපුරුම් බිමක් අවශ්‍ය නොවේ. පසේ යටට බොහෝ ගැඹුරට මුල් ඇදී යන බෝග වලට හෝ භූගත කඳන් (Underground Stems) ඇති බෝග වලට ගැඹුරට හාන ලද වැපුරුම් බිමක් අවශ්‍ය වන අතර, නොගැඹුරු මූල පද්ධතියක් ඇති රටඑළු, රතුළුනු වැනි බෝගවලට පසේ ජලය මනා ලෙස බැස යයි නම්, නොගැඹුරු හෑමක් සෑහේ. එමෙන් ම වැලි සහිත බුරුල් පසකට ගැඹුරු හෑමක් අවශ්‍ය නොවේ.

අනුවාදය—එස්. එන්. දිසානායක මහතා